# 3 භානා හීය පානා අඬහැරෙන් දැනේ

කිසියම් භාෂාවක් හා බැඳුණු සාහිත්‍යය ඒ ඒ භාෂාව භාවිත කරන සමාජයේ සුලමුල කියාපායි. පොතපත කියැවීමෙන් ලත් ශික්ෂණයෙන් යුතු වූ වියත් පඬිවරුන් විසින් ලියන ලද සම්භාව්‍ය ගණයේ සාහිත්‍යයකුත්, ජනයා අතරේ ම ඇති වී ජනයා අතරේ ම ආරක්ෂා වී, පැවත එන තවත් ජන කාව්‍ය සාහිත්‍යයකුත් සිංහල භාෂාව හා බැඳී පවතී. ශිෂ්ට සම්පන්න මිනිසාගේ හැඟීම් හා ඔවුන්ගේ දිවි පෙවෙත ඇසුරෙන් නිර්මාණය වුණු ජන කවිය ඉතා ඈතට ගිය ඉතිහාසයක් ඇත්තකි.

අනුරාධපුර යුගයේ ලියැවුණු සංයුත්ත නිකායට්ඨ කථාව වන පරමත්ථ ජෝතිකාවේ එන පාඨයක අදහස මෙසේ ය. 'මඟ අසබඩ කෙතක් රකිනා සිංහල කාන්තාවක ජාති, ජරා, මරණ ආදිය පිළිබඳව සිංහල බසින් කී ගීයක් අසා සඟ සැටනමක් රහත් වූහ' මෙයින් කියැවෙන්නේ ජන කවිය අනුරාධපුර සමය දක්වා ගිය දිගු ඉතිහාසයක් ඇති සාහිත්‍යයක් බවයි.

මිනිස් සන්තානය තුළ පවතින දුක, කනගාටුව, සතුට, කලකිරීම, කාන්සිය වැනි හැඟීම් හා බැඳුණු ජන කවිය, එම භාවයන් ප්‍රකාශනය කිරීම සඳහා නිතැතින් ම නිර්මාණය වූවකි. ඒ නිසා ම කාලයෙන් කාලයට, ප්‍රදේශයෙන් ප්‍රදේශයට ජන කවියේ වෙනස්කම් දැකිය හැකි ය. පොත්පත්වල ලියැවීමට පෙර මේ ජන කවි පැවතුණේ ඒවා භාවිත කළ මිනිසුන්ගේ මතකයේ ය. ජන කවියට කතුවරයෙක් නැත. මේ සාහිත්‍යාංගය කවරකු විසින් හෝ නිර්මාණය කරන ලදු ව, කාලයක් තිස්සේ භාවිත වීමෙන් ජනතාවගේ පොදු අයිතියක් බවට පත්වූවකි.

ගොයම් කවි, නෙළුම් කවි, කුරක්කන් කවි, පැල් කවි හා කමත් කවි වැනි ජන කවි කෘෂිකර්මය ආශ්‍රිත සී සෑම, වැපිරීම, පැළ නෙළුම, ගොයම් කැපීම හා මැඩවීම වැනි කටයුතු හා බැඳිණි. විවිධ රැකියාවල යෙදෙන්නෝ තම වෙහෙස නිවා ගැනීම සඳහා පතල් කවි, ගැල් කවි, බඹර කවි හා පාරු කවි ගැයූහ. කෙළි සෙල්ලම් ඇසුරෙන් ලී කෙළි, ඔළිඳ කෙළි, කළ ගෙඩි නැටුම්, ඔංචිලි වාරම් වැනි කවි නිර්මාණය විය. නැළවිලි ගීයෙන් නැළවී සැනසුණු දරුවා උපදේශාත්මක කවි අසා ජීවිතය හැඩගස්වා ගත්තේ ය. ආගමික විශ්වාස හා ඇදහිලි ගැමි ජනයා අතර සුලබ ය. ස්වාභාවික විපත්, ගොවිතැන් පාළු වීම් හා වසංගත ආදිය නිවාරණය කර ගැනීම සඳහා බලි තොවිල් හා ශාන්ති කර්මවල යෙදුණු ජනයා දෙවියන් උදෙසා පුදපූජා පැවැත්වූහ. එහි දී ද දෙවොල් මඩු, ගම්මඩු හා කෝල්මුර කවි ගායනා කළහ. විනෝදය හා ශෘංගාරය මුසු වුණු ජන කවි ද වෙයි. ප්‍රේමය හා ආදරය ප්‍රකාශ කිරීමට ද ජන කවිය යොදා ගත් අවස්ථා බොහෝ ය. තේරවිලි කවි, විවේකය දැනුවත්කමින් හා විනෝදයෙන් ගත කිරීම සඳහා යොදාගත් ජන කවි විශේෂයකි.

ජීවිතයේ දී විඳින්නට සිදු වන අපමණ දුක්ඛ දෝමනස්සයන්, බලාපොරොත්තු කඩවීම්, අනපේක්ෂිත ව්‍යසනයන්ට පත්වීම් වැනි දුක්බර අවස්ථා ද උපත, රංකිරි කටගෑම, ගුරු ගෙදර යාම, වැඩිවිය පැමිණීම, විවාහය හා මරණය වැනි ජීවිතයේ විවිධ අවස්ථා ද ජන කවියට වස්තු විෂයය විය.

සිංහල ජන කවිය තුළ දැකිය හැකි විශේෂ ලක්ෂණ කීපයකි. එදිනෙදා ජීවිතය හා බැඳුණු සිදුවීම් හා හැඟීම් ජන කවියේ අන්තර්ගතය වේ. එමෙන් ම සරල උපමා හා රූපක ආදියෙන් රසවත් වී ඇත. භාව පූර්ණ වාග්මාලාව ජන කවියාට සහජයෙන් උරුම වූවකි.

ජන කවිය විවිධ විරිත්වලින් රස ගැන්වේ. ඒ ඒ කාර්යයේ රිද්මය හා බැඳුණු විරිත ජන කවියේ ප්‍රධාන ලක්ෂණයකි. නැළවිලි ගී ගැයෙන්නේ ඉතා ම ලයාන්විත වූ නාද මාලාවකිනි. ඔරු හා පාරු පැදවීමේ දී තොටියා වෙහෙස වන ආකාරය රිද්මයානුකූල ව පාරු කවියේ විරිත හා බැඳේ. ගොයම් කවි හා නෙළුම් කවි, ඒ ඒ කාර්යයන්ගේ රටාව අනුව ගැයෙයි. ඔංචිල්ලාව පැද්දෙන තාලයට ඔංචිලි වාරම් කවි ගායනා කෙරේ.

පොදුජනයා අතරේ භාවිත වන සරල ජීවන රටාව හා බැඳුණු සිංහල ජන කවියේ විශේෂිත අංගයක් වූ 'දැනමුතුකමට කී කවි' හෙවත් 'උපදෙස් දීම සඳහා කී කවි' ගණයේ ලා සැලකෙන ජන කවි කීපයක් මෙහි දැක්වේ. මේ උපදෙස් කවි සෑම දේශයකට ම ඔබින, සෑම කාලයකට ම ගැළපෙන ඒවා ය. ඕනෑ ම තරාතිරමක, ඕනෑ ම වයසක පසු වන කෙනෙකුගේ ජීවිතය හැඩ ගස්වා ගැනීමට ඒවායින් ලබා දෙන උපදෙස්, උපකාර වේ.

ගසට කෙටුම ගස මුල පෑයුමෙන් දැනේ
මිනිහා නොමිනිහා යන කඩිසරෙන් දැනේ
අමුතු බත් දීම අත ඇල්ලුමෙන් දැනේ
හානා හීය පානා අඬහැරෙන් දැනේ

නහින දෙහින කාලෙට පින් කෙරුම යුත
වහින කලට කුරින් විල්වලින් එත
බහින දියෙන් දෝතක් මුත් ගතොත් ඇත
පනින රිලවුංට ඉනිමං කමක් නැත

වරද පෙනෙන තරමට වැරදුණා නොවේ
වරද ඇතත් නිකරුණේ වැඩ කළා නොවේ
වරද පෙනෙති වැඩ නූගත් අයට ලොවේ
වරද නැති කෙනෙක් නැත සකිය මේ ලොවේ

ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු
බොරැල්ලේ තරම දැනගෙන උඩ පනිනු
කඩුල්ලේ තරම දැනගෙන කද බඳිනු
තමුන්ගේ තරම දැනගෙන කල් හරිනු



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ඇස නැති දා පොත ගත්තේ කියන්ට ද
දත නැති දා උක් දඬු ගිනි තපින්ට ද
වෙර නැති දා ගහගත්තේ දින්නට ද
යුද ඇති දා නැති කග කොස් කොටන්ට ද

එක් උන දාට උක් දණ්ඩේ පැණි සේමා
වෙන් උන දාට යක් දෙබරේ වද සේමා
ගොසින් ගොසින් කටු අත්තේ අග සේමා
ඉතින් ළඳේ කරිවිල තිබ්බටු සේමා

රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩ ගිනි නැද්ද
මිණි බරණින් සැදු මුත් ගත නොදිරද්ද
පැණිවරකා ගසටත් හෙණ නොවදිද්ද

අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලි එළිය දැක ගිනිහුළ දියේ හෙලා
අනුන් ලියන් දැක තම ලියට තල තලා
දුවන මුවන් දැක නොදමන් නෙළුව පලා

## අරුත් පැහැදිලි කිරීම

| | |
|---|---|
| කඩිසරෙන් | - ගමනේ ස්වරූපයෙන් |
| අඬහැරෙන් | - සී සාන ගවයා දිරිමත් කිරීමට නගන ශබ්දය |
| කමක් නැත | - වැඩක් නැත/ ප්‍රයෝජනයක් නැත |
| සකිය | - යහළුවේ / මිතුරේ |
| ගොඩැල්ල | - උස් ගොඩබිම් කඩ |
| බොරැල්ල | - ගල් බොරළු |
| කග | - කඩුව |
| යක් දෙබරේ | - බිම සාදන දෙබරයක් (එහි වසන දෙබරුන් බොහෝ විෂ සහිත බව ගැමි ජනයාගේ විශ්වාසයයි.) |
| ගිනි හුළ | - ගමන බිමනේ දී ආලෝකය ලබා ගැනීම සඳහා පොල් අතු, හනසු ආදියෙන් තනා ගන්නා පන්දම/ හුළු අත්ත |

## අභ්‍යාස

**පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

01. උදාහරණ ගෙනහැර පාමින් අපූරු ආකාරයකට උපදෙස් දෙන්නට ජන කවියා තුළ වූ හැකියාව පද්‍ය පන්තිය ඇසුරෙන් විමසන්න.

02. යහපත් ජීවිතයක් සඳහා ජන කවියෙන් ලද හැකි ආභාසය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

03. ජන කවියා තම නිර්මාණය රසවත් කිරීමෙහි ලා කාව්‍යාලංකාර යොදා ගෙන ඇති ආකාරය උදාහරණ මගින් පහදන්න.

04. ජන කවියේ දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ, උපදෙස් කවි තුළ ද දැකිය හැකි ය. උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

05. 'අවවාද අනුශාසනා දීමේ දී කවියා ඉතා සංයමයෙන් එම කාර්යය ඉටු කරන්නට වග බලා ගනී' මේ ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද'යි හේතු සහිත ව විස්තර කරන්න.